www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සවුදි අරාබියේ මරන දන්ඩනයට මුහුන දී සිටින තරුන ගෘහ සේවිකාවට ශ්‍රී ලංකාවෙන් නීති ආධාර නොලැබේ

## No Sri Lankan legal aid for young maid facing death sentence in Saudi Arabia

**විලානි පීරිස් විසිනි**
**2007 අගෝස්තු 21**

සවුදි අරාබි ශ්‍රේෂ්ඨාධිකරනයේ අභියාචනයක් ගොනු කරනු ලැබ ඇතත් ශ්‍රී ලංකා ගෘහ සේවිකා රිසානා නෆීක්ගේ ඉරනම අවිනිශ්චිත ය. සිය හාම්පුතාගේ දරුවා ඝාතනය කිරීමේ චෝදනාවට ඇය ජුනි මාසයේ මරන දන්ඩනයට නියම කරන ලදි. මෙම නඩුව සවුදි නීති පද්ධතියේ ප්‍රතිගාමී ස්වභාවය පමනක් නොව මැද පෙරදිග සිටින ලක්ෂ සංඛ්‍යාත කොන්ත්‍රාත් කම්කරුවන් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා ආන්ඩුව දක්වා ඇති අපොහොසත් භාවය ද එලිදරව් කර තිබේ.

දහ නව හැවිරිදි නෆීක් මීට දෙවසරකට ඉහත දී සවුදි අරාබියට ලඟා වූයේ දවදමීහි ගෘහ සේවිකාවක ලෙස සේවය කිරීමට නමුදු ඇගේ බොහොමයක් සෙසු කටයුතු සමග ලඳරුවකු බලා ගැනීමට ද ඇයට බල කෙරුනි. දරුවන් රැක බලා ගැනීම පිලිබඳ කිසිදු පලපුරුද්දක් හෝ පුහුනුවක් ඇයට නොවී ය. 2005 මැයි මස දී නෆීක් ඔහුට බෝතලයකින් කිරි පොවමින් සිටිය දී ලඳරුවා මිය ගියේ ය.

නෆීක්ට අනුව, ඇය තනිව ම දරුවාට කිරි පොවමින් සිටි අතර එහි දී ඔහු හිටිවන ම හුස්ම හිරවීමකට ලක් විය. ඇය උදව් ඉල්ලා කෑගැසූ නමුත් දරුවාගේ මව පැමිනීමට පෙර ඔහු මිය ගියේ ය. දරුවාගේ ගෙල හිර කොට මරා දැම්මා යැයි නෆීක්ට චෝදනා කල දෙමව්පියෝ ඇය දවදමි පොලීසියට භාර දුන්හ. එම පවුලේ පැත්ත ගත් පොලීසිය, මිනීමැරුම සම්බන්ධයෙන් පාපොච්චාරන කරමින් ප්‍රකාශයකට අත්සන් කරන ලෙස ගෘහ සේවිකාවට බල කලේ ය.

නෆීක්, පොලීසිය තමන්ට තර්ජනය කල බව ප්‍රකාශ කරමින්, පෙබරවාරියේ දී උසාවිය හමුවේ සිය පාපොච්චාරනය ප්‍රතික්ෂේප කලා ය. දවදමි උසාවිය ඇගේ එම ප්‍රකාශය නොතකා හැර ජුනි 16 දා ඇයට මරන දඬුවම නියම කලේ ය. සවුදි අරාබියේ මරන දඬුවම් ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රසිද්ධියේ ගෙල සිඳ දැමීමෙනි. අභියාචනයක් සඳහා අවසන් දිනය යෙදී තිබුනේ ජුලි 16 දා ය.

කිසිදු නීතිමය ආධාරයකින් තොරව ඇය හුදකලාවට අතහැර දමා, ශ්‍රී ලංකා ආන්ඩුව මෙම තරුන කොන්ත්‍රාත් සේවිකාවගේ ඉරනම සම්බන්ධයෙන් මුලුමනින් ම නොතකා සිටියේ ය. මොන යම් හෝ ආධාරයක් වෙනත් රටක ස්වෛරී භාවය උල්ලංඝනය කිරීමකට සම වනු ඇතැයි එය කියාපෑවේ ය.

ඔවුන් සේවය කිරීමට යන රටේ සංස්කෘතිය, හැසිරීම හා නීතිය සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කම්කරුවන් වීමට යන අය දැනුවත් කිරීමට සිය කාර්ය මන්ඩලය ක්‍රියා කරන බව, විදේශ සේවා ඇමති කෙහෙලිය රඹුක්වැල්ල මාධ්‍ය හමුවේ පැවසී ය. "නමුත් ඔවුන් කරදරයට පත් වූ විට එම රටේ නීතිය ක්‍රියාත්මක වනු" ඇතැයි ඔහු ප්‍රකාශ කලේ ය.

අභියාචනයක් සඳහා අවශ්‍ය නීති ගාස්තු වෙනුවෙන් ආන්ඩුව කිසිදු ප්‍රතිපදානයක් නොකලේ ය. රියාද්හි පාදක නීතිඥයකු වන කටෙබ් ෆහාද් අල්-ශමාරි ඒ වෙනුවෙන් සවුදි රියාල් 250,000ක් (එ.ජ. ඩොලර් 67,000) අය කලේ ය. එය වනාහි නෆීක්ගේ පවුලට දැරිය නොහැකි මුදලකි. ආසියානු මානව හිමිකම් කොමිෂම සවුදි රියාල් 50,000ක ආරම්භක ගෙවීමක් කල අතර සෙසු ආධාරකරුවන් ඉතිරියට දායක වී ඇත.

තමන් "මේ දිනවල නඩුව සම්බන්ධයෙන් සියලු තොරතුරු සහිතව උසාවියේ ගොනු කෙරෙන සවිස්තරාත්මක විරෝධතා ලියවිල්ලක් සැකසීමෙහි" යෙදී සිටින බව අල්-ශමාරි ඇරබ් නිව්ස් පුවත් පතට පැවසී ය. නෆීක්ගේ "පාපොච්චාරනය" බලාත්කාරයෙන් ලබා ගත් එකක් බැවින් එය පසෙකින් තබන ලෙස ඉල්ලා සිටීමට ඔහු සූදානම් වේ. ලඳරුවාගේ මරනය සිදු වන අවස්ථාවේ නෆීක් වැඩිහිටියකු නොවේ යන කරුන මත පදනම්ව යලි සලකා බැලීමක් කරන ලෙස ද නීතිඥවරයා ඉල්ලා සිටී.

ජාත්‍යන්තරව හා දේශීයව උත්සුකතා පැන නගින තතු යටතේ තව දුරටත් නඩුව ගැන නොතකා සිටීමට ශ්‍රී ලංකා ආන්ඩුවට නොහැකි විය. සහයෝගය ප්‍රකාශ කිරීමෙහි හිස් ප්‍රයත්නයක යෙදෙමින්, නියෝජ්‍ය විදේශ ඇමති හුසේන් බහිලා අවසානයේ ජුලි 20 දා මහත් පම්පෝරියකින් යුක්තව ප්‍රකාශ කලේ, තමන් තරුනිය බේරා ගැනීමට පියවර ගන්නා බව යි. බලධාරීන්ට ආයාචනා කරනු පිනිස ඔහු තරුනියගේ පියා වන මොහොමඩ් සුල්තාන් නෆීක් හා ඇගේ මව වන ෆරීනා නෆීක් සමග සවුදි අරාබියට ගියේ ය.

සිය ව්‍යායාමයේ පවත්නා මුහුන බේරා ගැනීමේ ස්වභාවය ප්‍රකාශයට පත් කරමින් බහිලා සම්මුඛ සාකච්ඡාවක දී මෙසේ පැවසී යඃ “අපට කොන්සියුලර් ආධාර ලබා දෙන්න පුලුවන්, ඒත් නීති සේවා සඳහා මූල්‍ය ආධාර ලබා දෙන්න නම් විධි විධාන නැහැ.” ඔහු තව දුරටත් මෙසේ ද පැවසී යඃ “දඬුවමට නියම වූ තරුනියගේ ජීවිතය බේරා ගන්න මේ දැන් ආන්ඩුවට කරන්න පුලුවන් දේ සීමිතයි.”

ක්ෂමාව ඉල්ලා ආයාචනා කරනු පිනිස නෆීක්ගේ හාම්පුතුන් හමුවීමට බහිලා උත්සාහ කල නමුත් දෙමව්පියෝ එවන් හමුවක් ප්‍රතික්ෂේප කලහ. මිය ගිය දරුවාගේ පියා වන නයිෆ් ජිශියාන් කලිෆ් අල් ඔටයිබෝ කිසිදු සහනයක් දීම මේ වන තෙක් ප්‍රතික්ෂේප කර තිබේ. නෆීක්ගේ දෙමව්පියන් බන්ධනාගාරයේ සිටින සිය දියනිය බැලීමට ගිය අතර ඔවුන් සමග ශ්‍රී ලංකාවට ආපසු යාමට අවසර දෙන ලෙස ඇය අයැද සිටියා ය. කිසිදු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට අපොහොසත් වීම නොතකා බහිලා ජුලි 29 දා ආපසු පැමිනි වහාම මෙසේ පුරසාරම් දෙඩී යඃ “කල හැකි දේ අපි කරලා තියෙන්නෙ. මට හොඳටම විශ්වාසයි එය එල දැරිය යුතුයි කියා.”

නෆීක්ගේ නිදහස සහතික කර ගැනීමට උත්සාහ කරනවා වෙනුවට ශ්‍රී ලංකා බලධාරින්ගේ ප්‍රයත්නය යොමු වී ඇත්තේ අවධානය ද්විතියික කරුනු දෙසට අපසරනය කිරිමට යි. ඇයගේ වයස අවුරුදු 23ක් ලෙස පෙන්වන ව්‍යාජ උප්පැන්න සහතිකයක් මත පදනම්ව සවුදි අරාබියේ සේවය පිනිස කොන්ත්‍රාත්තුවකට එලඹෙන විට නෆීක් යන්තම් 17 හැවිරිදි විය. ආන්ඩුව දැන් අඩු වයසේ සේවකයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු අය පිලිබඳ විශාල හාහුවක් ගෙන යයි.

අගෝස්තු 2 දා අමාත්‍ය මන්ඩල ප්‍රකාශක අනුර ප්‍රියදර්ශන යාපා ප්‍රවෘත්ති සාකච්ඡාවක දී මෙසේ පැවසී යඃ “ග්‍රාම නිලධාරියාගෙන් පටන් ගෙන විදේශ රැකියා ඒජන්සිය දක්වා මෙම සිද්ධියට සම්බන්ධ සෑම පුද්ගලයකුට ම විරුද්ධව අවශ්‍ය පියවර ගැනීමේ ක්‍රියාදාමයක බලධාරින් යෙදී සිටිනවා.” නෆීක් බේරා ගැනීම සම්බන්ධ වගකීමෙන් ආන්ඩුවේ අත් මුලුමනින් ම සෝදා ගනිමින්. ඔහු ප්‍රකාශ කලේ ජාත්‍යන්තර මානව හිමිකම් ආයතන ඇගේ නඩුව ගැන ක්‍රියා කරන බව යි.

නෆීක්ගේ නඩුව සවුදි අරාබියේ හා මැද පෙරදිග විදේශ කොන්ත්‍රාත් කම්කරුවන් මුහුන දෙන රුදුරු කොන්දේසි අවධාරනය කරයි. සාමාන්‍ය මට්ටමේ නුපුහුනු කටයුතු සඳහා සේවයේ යොදවනු ලබන ඔවුන්ට ඉතා අඩු වැටුප් ගෙවන අතර නීතිමය හිමිකම් නැති තරම් ය. විශේෂයෙන් ම ගෘහ සේවිකාවන්ට සලකනු ලබන්නේ වහල් ශ්‍රමිකයන්ට වඩා නොඅඩු ආකාරයෙනි. දිනකට දිගු පැය ගනනක් වැඩ කිරීමට බල කෙරෙන ඔවුහු නිරන්තරයෙන් ම අපයෝජනයන්ට ගොදුරු වෙති.

නෆීක්ගේ මව *ඇසෝසියේටඩ් ප්‍රෙස්* පුවත් සේවය සමග මෙසේ පැවසුවා යඃ “මගේ දුව මිනී මැරුම් නඩුවකට අහු වෙලා කියලා දැන ගත්තා ම මං කම්පනයට පත් වුනා. ඒ මොකද කියනවා නම්, එයා හරිම අහිංසකයි, ඒ වගේ වරදක් කරන්න හිතන්න තරම් එයා තරුන වැඩියි. එයා කිහිප වතාවක් ම අපට ලියුම් එවලා තිබුනා එයාට දිනපතාම විශාල වැඩ තොගයක් පැවරිලා තියෙනවා, පාන්දර තුනට ඇහිරිලා ගොඩක් රෑ වෙනකන් වැඩ කරන්න සිද්ධ වෙලා තියෙනවා කියලා. එයාගේ හාම්පුතා එයාට නරක විධියට සලකන හැටිත් එයාට වධ දෙන හැටිත් එයා ඒ ලියුම්වල අපට කියලා එව්වා. එයා වැඩ කරන ගෙදර බලා ගන්න කියලා තමයි එයා යැව්වෙ, ලමයි බලා ගන්න නෙවි. ඒක එයාගේ ගිවිසුමේ තිබුනෙ නැහැ.”

සවුදි අරාබියේ සංක්‍රමනික කම්කරුවන් මිලියන 8ක් පමන සිටින අතර ඔවුන්ගෙන් 400,000ක් ශ්‍රී ලාංකිකයෝ ය. මෙම දැවැන්ත විදේශීය ශ්‍රම බලකාය අතරින් මතු වන මොන යම් හෝ අසන්තෘප්තියක් හෝ විරුද්ධත්වයක් මර්දනය කිරීමේ විධි ක්‍රමයක් ලෙස රටේ දරුනු නීති රීති බලාත්මක කිරීමේ දී සවුදි අරාබි තන්ත්‍රය කිසිදු පැකිලීමක් නොදක්වයි. මෙම වසරේ පමනක්, මේ වන තෙක් මරන දඬුවම් 103ක් ක්‍රියාවට දමා ඇති අතර එයට විදේශ කම්කරුවන් ගනනාවක් ම ඇතුලත් වේ. පසුගිය පෙබරවාරියේ දී ශ්‍රී ලාංකිකයන් හතර දෙනෙකුගේ හිස් ගසා දමන ලදි.

ඔවුන් වෙනුවෙන් බලගතු ලෙස මැදිහත් වීමට ශ්‍රී ලංකා ආන්ඩුව ප්‍රතික්ෂේප කිරීම ගලා එන්නේ මැද පෙරදිගෙන් සම්ප්‍රේශනය වන විදේශ විනිමය මත එයට පවත්නා ආර්ථික පරාධීනත්වයෙනි. පසුගිය වසරේ දී, විදේශවල සේවය කරන ශ්‍රී ලාංකිකයන් මිලියන 1.5ක් එ.ජ. ඩොලර් බිලියන 2.3ක් සිය රටට එවා ඇතැයි තක්සේරු කෙරෙයි. මේ වසරේ මුල් මාස පහ තුල දී, එලෙස සම්ප්‍රේශනය වූ මුදල ඩොලර් බිලියන 1.09ක් වන අතර එය පසුගිය වසරේ එම කාලය තුල ලද මුදලට සංසන්දනාත්මකව සියයට 17ක නැගීමකි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ දිවයින යලි සිවිල් යුද්ධය කරා ඇද දමා ඇති හෙයින් විදේශ ඉපැයුම් ප්‍රවාහය වඩාත් තීරනාත්මක අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. පසුගිය වසර මුලුල්ලේ ආන්ඩුව දැවැන්ත වසයෙන් මිලිටරි උපකරන මිල දී ගෙන ඇති අතර මේ වසරේ මිලිටරි වියදම් යලිත් ඉහල දමා ඇත. රාජපක්ෂගේ ඉහල ම ප්‍රමුඛත්වය ලැබෙන්නේ මැද පෙරදිගට කෙරෙන ලාභ ශ්‍රම වෙලඳම පවත්වා ගෙන යාම සඳහා මිස කොන්ත්‍රාත් කම්කරුවන් මත පැටවෙන සූරාකෑමේ කොන්දේසිවලට විරුද්ධ වීම පිනිස නොවේ. රිසානා නෆීක්ගේ ඉරනම ගැන ආන්ඩුවට මොන යම් හෝ උත්සුකතාවක් නැති තරම් ය.



© www.wsws.org